# විඤ්ඤාණය හා විඥප්තිමාත්‍රතාව

කරපික්කඩ සෝභිත හිමි

CamScanner



# විඤ්ඤාණය හා විඥප්තිමාත්‍රතාව

## කරපික්කඩ සෝභිත හිමි

දර්ශනයක්, සංස්කෘතියක් මෙන් ම විමුක්ති මාර්ගයක් වශයෙන් බුදුදහම එහි ආරම්භක අවස්ථාවේ සිට ම ක්‍රියාත්මක විය. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ධර්මය ශාස්ත්‍රීය අධ්‍යාපනයේ දී ආදි බුදුදහම සහ නිකායාන්තර බුදුසමය යන මැයෙන් දෙයාකාරය. සංසාරගත සත්ත්වයාගේ විමුක්තිය නිර්දේශිත මූලික බුද්ධ දේශනාවේ අරමුණ දුක්ඛ නිස්සරණය ප්‍රකට කිරීම ය. එම අරමුණින් බැහැර නොවූ ආදි බුදුදහම ප්‍රමුඛ කොට ගත්, එයින් උපන් අතිරේක, විශේෂ විමර්ශන හා අර්ථකථා කේන්ද්‍රකොටගත් චින්තන සම්ප්‍රදාය නිකායාන්තර බුදුසමය නම් වේ. එය ද ආදි නිකායාන්තර හා පශ්චාත් නිකායාන්තර බුදුසමය මැයෙන් දෙයාකාර ය. මුල් බුදුසමයෙහි මෙන් ම නිකායාන්තර ඉගැන්වීම්හි දී ද චිත්ත, මනෝ සහ විඤ්ඤාන යන වචනත්‍රයෙන් අර්ථවත්වන මනස හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විග්‍රහයට ලැබෙන්නේ ප්‍රමුඛස්ථානයකි. විඥානය හා එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ආදි බුදුසමයේ විවරණ කේන්ද්‍ර කොටගෙන විඥප්තිමාත්‍රතා සිද්ධාන්තය නිර්දේෂ කරනු ලබන යෝගාචාර විඥානවාදී දර්ශනය, විඥානය පිළිබඳ ඉදිරිපත් කර ඇති විග්‍රහය ලුහුඬින් වුව ද ශාස්ත්‍රීය පර්යේෂණ රාමුව මත ඉදිරිපත් කිරීමට ප්‍රයත්න දරන මෙම කුඩා කෘතිය බෙහෙවින් ඵලදායී උත්සාහයකි, සාර්ථක ප්‍රතිඵලයකි.

මෙහි කතුවරයා වන කරපික්කඩ සෝභිත හිමියෝ උතුරු මැද පළාතේ බෙහෙවින් ප්‍රකට තන්තිරිමලේ රජමහා විහාරීය සඟ ගණයේ පුරුකකි. උන්වහන්සේ සිය මූලික අධ්‍යාපනය වාරියපොළ ශ්‍රී සුමංගල පිරිවෙනෙන් නිමකොට උසස් අධ්‍යාපනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූහ. කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයෙහි අධ්‍යාපනය ලැබ බෞද්ධ දර්ශනය පිළිබඳ විශේෂවේදී උපාධියක් ලද දීප්තිමත් ආදි විද්‍යාර්ථයෙකි. මනා ශාස්ත්‍රීය නිපුණත්වයකින් හෙබි උන්වහන්සේ දැනට කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයෙහි සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස ද, අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයෙහි බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කරයි. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය කටයුතු සම්බන්ධ ක්‍රියාවලියේ දී මෙන්ම අධ්‍යනාංශයේ විෂය බාහිර කටයුතුවල දී ප්‍රමුඛත්වයක් ගෙන ක්‍රියාකරන උන්වහන්සේට මෙබඳු කෘතියක් රචනා කිරීමේ මෙහෙවර උදෙසා අප සැමගේ කෘතඥතා පූර්වක ස්තුතිය හිමිවිය යුතු ය.

ආචාර්ය
නාඹටුන්නේ විමලඥාන හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ISBN : 978-955-0838-02-8
9 789550 838028
මිල රු. 300/-

CamScanner

විඤ්ඤාණය හා විඥප්තිමාත්‍රතාව

ප්‍රථම මුද්‍රණය: 2013

© කරපික්කඩ සෝභිත

මුද්‍රණය:

විද්‍යාලංකාර මුද්‍රණාලය,

පෑලියගොඩ.

CamScanner

# හැඳින්වීම

බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව සිදු වූ ධර්ම සංගායානාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස පසුකාලීනව සසුන තුළ ක්‍රමිකව නොයෙකුත් දාර්ශනික සංකල්ප රාශියක් නිර්මාණය විය. මෙම දාර්ශනික මතවාදයන් පිළිබඳ විමසා බැලීමේ දී මේවා සියල්ල ආදි බුදුසමය පදනම් කොටගෙන එහි සංවර්ධනයක් ලෙස නිර්මාණය වන්නට ඇතැයි සිතිය හැකිය. මෙසේ නිර්මාණය වූ ප්‍රධාන දාර්ශනික සම්ප්‍රදායයන් සතරකි.

01. සර්වාස්තිවාද (වෛභාෂික)
02. සෞත්‍රාන්තික (ක්ෂණවාදී)
03. මාධ්‍යමික (ශූන්‍යතාවාදී)
04. විඥානවාදී (යෝගාචාර)

බුදුසසුන තුළ මෙසේ නිකායාන්තර මතවාදයන් නිර්මාණය වන්නේ ආනුභවික වූ විෂය වස්තූන්ගේ පැවැත්මේ ස්වභාවය පිළිබඳ විවිධ වූ මතවාදයන් ඉදිරිපත් වීම තුළිනි. ඓතිහාසික වශයෙන් ප්‍රථමයෙන් බිහි වූ සම්ප්‍රදායෙහි අර්ථකථනයන් විවේචනයට ලක්කිරීම් වශයෙන් හා ස්වමතයන් ඉදිරිපත් කිරීම තුළින් අනෙකුත් සම්ප්‍රදායයන් බිහි වී ඇත.

ආනුභවික විෂය වස්තූන්ගේ සර්ව අස්තිත්වයක් පෙන්වා දෙමින් බාහ්‍යාර්ථප්‍රත්‍යක්ෂවාදයක් ඉදිරිපත් කළ පිරිස සර්වාස්තිවාදී වූහ. එසේ ම බාහිර විෂය වස්තු පිළිබඳ ක්ෂණික අවස්ථාවක් පෙන්වා දුන් සෞත්‍රාන්තිකයෝ



CamScanner

බාහ්‍යාර්ථඅනුමේයවාදය ඉදිරිපත් කළහ. බාහිර විෂය වස්තු සියල්ල පිළිබඳ මාධ්‍යමික ඉගැන්වීම වූයේ ශූන්‍යතාවය යි. එසේ ම මෙම සියලු මතවාදයන්ට පිළිතුරු සැපයූ යෝගාචාරීන් ආනුභවික විෂය වස්තූන් පිළිබඳ දැක් වූ ආකල්පය වූයේ විඥප්තිමාත්‍රතා සංකල්පය යි.

මෙම විඥප්තිමාත්‍රතාවය ද සෘජු යෝගාචාර නිර්මාණයක් නොව, එය ආදී බුදුසමය තුළ දක්නට ලැබෙන විඥානය පිළිබඳ සියුම් වූ ආකල්පයක් විග්‍රහයට ලක් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වන්නට ඇතැයි සිතිය හැකිය.

මූලාශ්‍රය අනුව ආචාර්ය මෛත්‍රිනාථයන්ගෙන් ආරම්භ වූ මෙම දාර්ශනික විග්‍රහය පසුකාලීනව අසංග, වසුබන්ධු, දින්නාග, ධර්මපාල, ශාන්තරක්ෂිත, කමලශීල ආදී වූ යතිවරයන්ගේ අතින් පෝෂණය වූවකි.

''විඥානය හා විඥප්තිමාත්‍රතාව'' නම් වූ මෙම ග්‍රන්ථය තුළින් විඥානය පිළිබඳ මුල් බුදුසමයේ ඉගැන්වීම් මෙන් ම, නිකායාන්තර අදහස ද විමර්ශනය කොට ඒ පිළිබඳ යෝගාචාර මතය කවරදැයි තුලනාත්මකව අධ්‍යයනය කරනු ලබයි.

බෞද්ධ දාර්ශනික ලෝකයේ මෙන් ම, බටහිර මනෝවිද්‍යාව, පාරභෞතික විද්‍යාව ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක ම සාකච්ඡාවට ලක් වූ දාර්ශනික සංකල්පයක් ලෙස ''විඥාන සංකල්පය'' පෙන්වා දිය හැකිය. විඥානය යනු කුමක්දැයි විමසා බැලීමේ දී මෙම පදය තුළ පර්යාය පදයන් කිහිපයක් දක්නට ලැබේ. මුල් බුදුසමය තුළ ''විඤ්ඤාණ'' යන්නට

පර්යායව ''චිත්ත, මන'' යන පදයන් භාවිත කොට ඇති අයුරු දක්නට ලැබේ.

''යඤ්ච ඛො එතං භික්ඛවෙ වුච්චති චිත්තං
ඉතිපි මනො ඉතිපි විඤ්ඤාණං''

එසේ ම නිකායාන්තර බුසමය තුළ ද විඥාන යන්නට පර්යාය භාවිතයන් රාශියක් දක්නට ලැබේ.

**''විඤ්ඤාණක්ඛන්ධ, චිත්ත, මනො, මනස, හදය, පණ්ඩර, මනායතන, මනින්ද්‍රිය, තච්ජමනො, විඤ්ඤාණ ධාතු''**

මීට අමතරව විඥානය යන පදයට පසු කාලීනව භාවිත වන අර්ථවිවරණයන් පිළිබඳව විමසා බැලීම වැදගත් වේ. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය ''විඥාන'' යන පදයට අර්ථ විවරණ සපයන්නේ,

**''විශේෂ වූ ඥානය, දැනීම, චිත්තය, සංඥාව වැනි වූ අරමුණු පිළිබඳ විශේෂ විභාග දන්නා චිත්ත ගතිය, විශේෂ ඥානය''** යනුවෙනි.

අලගියවන්න සංස්කෘත - සිංහල ශබ්දකෝෂය තුළ ''විඥානය'' යන පදයට අර්ථ රාශියක් දක්වා ඇත. **''නුවණ, දැනීම, බුද්ධිය, විවේචනය, විමසුම් නුවණ, පුරුද්දෙන් ආ දැනුම, ව්‍යවසාය, රැකියාව''** යනුවෙනි.

මෙයට සමාන වූ අර්ථයක් සිරි ලියනගේ නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය තුළ හමු වේ. එහි දී විඥාන යන්නට අර්ථ දක්වා ඇත්තේ **''අරමුණු පිළිබඳ විශේෂ විභාග දන්නා චිත්ත ස්වභාවය, සිත, චිත්ත''** යනුවෙනි.

''විඥානය'' යන පදයට ඉංග්‍රීසි භාවිතය ලෙස දක්වෙන්නේ **"Consiousness"** යනුවෙනි. මේ සඳහා මලලසේකර ඉංග්‍රීසි - සිංහල ශබ්දකෝෂය අර්ථ සපයන්නේ **''විඥානය, සිහි ඇති බව, සංජානනය, දැනීම, සම්ප්‍රජානනය''** යනුවෙනි.

මෙසේ විඥානය යන පදය තුළින් මනෝ භාවාත්මක පැතිකඩක් අර්ථවත් වන බව පෙනී යයි. දාර්ශනික ලෝකය තුළ මනස පදනම්ව සිදු කරනු ලබන අර්ථ විවරණ, මතවාද, සංකල්ප සියල්ල සමස්තයක් ලෙස ''විඥානවාදය'' ලෙස දක්වේ.

''විඥානවාදය'' යනු කුමක්දැයි නිවැරදිව තේරුම් ගැනීමේ දී මේ සඳහා භාවිත වී ඇත්තා වූ අර්ථවිවරණ පිළිබඳව විමසා බැලීම ඉතා වැදගත් වේ. විඥානවාදය සඳහා වූ ඉංග්‍රීසි භාවිතය **"Idealism"** යනුවෙනි. මේ සඳහා අර්ථ දක්වන්නා වූ මලලසේකර ඉංග්‍රීසි - සිංහල ශබ්ද කෝෂය ''විඥානවාදය, පරමාදර්ශවාදය'' යනුවෙන් අර්ථ දක්වා ඇත.

එසේ ම හරිශ්චන්ද්‍ර විජයතුංග නූතන සිංහල පාරිභාෂික ශබ්දකෝෂය තුළ ''විඥානවාදය'' යන්නට අර්ථ දක්වා ඇත්තේ **''පරමාදර්ශය පදනම් කොට තිබෙන ඕනෑම වාදයක්, හිත, ආත්මය, ජීවය, භූතාත්මය මුල් තැන තබා සලකන ධර්මයක්''** වශයෙනි. එසේ ම ධංවදෙරා ඉංග්‍රීසි ශබ්දකෝෂයේ දී **"Idealism "** යන පදය සඳහා අර්ථ තුනක් දක්වා ඇත.

01. පරමාදර්ශයන් ගොඩනැගීම හෝ අනුගමනය කිරීම

**(Forming or Pursuing Ideals)**

02. පරමාදර්ශී ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම, සිදු කිරීම

**(Representation of things in Ideal form)**

03. විඥාන මත පදනම් වූ වාස්තවිකත්වයක් පිළිබඳ දරනු ලබන යම් චින්තන ස්වරූපයක්

**(system is thougt is which Objects are held to be in some way dependent on tha mind)**

මේ සියලු අර්ථ විවරණයන්ට අනුව විඥානවාදය යන අදහස සන්දර්භ දෙකක් ඔස්සේ විමසිය හැකිය.

01. සාමාන්‍ය අර්ථය
02. පාරභෞතික අර්ථයක් දක්වන දාර්ශනික අර්ථය

මෙහි ''සාමාන්‍ය අර්ථය'' යනු පරිකල්පනය කළ හැකි පරමාදර්ශී උසස් ම තත්ත්වය යි. දෙවන අර්ථය නම් පරම පදාර්ථය විඥානය වශයෙන් ගෙන විඥානය පාරභෞතික පදාර්ථයක් වශයෙන් සලකා කරනු ලබන දාර්ශනික ඉගැන්වීම යි. දාර්ශනික චින්තාව තුළ විඥානවාදයෙහි කොටස් 02ක් දක්නට ලැබේ.



CamScanner

01. වාස්තවික විඥානවාදය

**Objective Idealaism**

02. ආත්මීය විඥානවාදය

**Subjective Idealaism**

"වාස්තවික විඥානවාදය" යනු මිනිස් සන්තානයෙන් ස්වාධීනව සිටින, ද්‍රව්‍යයෙන් ස්වාධීනව සිටින හෝ ද්‍රව්‍යයට ප්‍රාථමික වූ විෂය මූලික විඥානයක් මඟින් ලොව නිර්මිත බව පිළිගැනීම යි.

"ආත්මීය විඥානවාදය" යනු අපගේ ඉන්ද්‍රිය සංජානනයෙන් ස්වතන්ත්‍ර බාහිර ලෝකයක් නැත. ඇතැයි සළකා ගන්නා බාහිර ලෝකය අපගේ ඉන්ද්‍රියානුසාරී අත්දැකීම් හා මනෝභාවයන්ගේ සටහනක් පමණක් බව දැක්වීම යි. හෙවත්, බාහිර ලෝකය පුද්ගල විඥානයේ නිර්මිතයක් ලෙස සැලකීම යි.

මීට අමතරව බටහිර ලෝකයේ විඥානවාදය පිළිබඳ අදහස් රාශියක් දක්නට ලැබේ. භෞතිකවාදීහු "විඥානය" පාරභෞතික තත්ත්වයක් නිසා ස්වාධීන ස්වතන්ත්‍ර පැවැත්මක් ඇති දෙයක් ලෙස නොපිළිගත්හ. මෙසේ බටහිර ලෝකයේ ''විඥානය'' යන්න පාරභෞතික අර්ථයෙන් විවරණය වීම නිසා නොයෙකුත් වාද විවාද බිහි වී ඇත.



CamScanner

- විඥානවාදය
- ස්වසන්තානමාත්‍රවාදය
- ආත්මීය විඥානවාදය
- වාස්තවික විඥානවාදය

යනුවෙන් ඔවුන් ඒවා නිර්වචනය කොට ඇත. මාක්ස්වාදීන්ගේ අදහස වන්නේ ලොව සියලු ආගම් විඥානවාදී වන බව ය. ඒවා භෞතිකවාදයට විරුද්ධ ය. ඊට හේතුව විඥානවාදී ප්‍රවාහය ද්‍රව්‍ය අප්‍රධාන වශයෙන් ද විඥානය ප්‍රධාන වශයෙන් ද සළකන බැවිනි.

විඥානවාදය පිළිබඳ ඉතා වැදගත් අදහසක් ඉදිරිපත් කළ බටහිර දාර්ශනිකයෙක් ලෙස **බිෂොප් ජෝර්ජ් බාර්ක්ලේ** හැඳින්වේ. ඔහු භෞතික ලෝකයක් හෝ ද්‍රව්‍යයක් කියා දෙයක් නොමැති බවත්, බාහිර වස්තු හා ලෝකය වශයෙන් අප දකින්නේ මනසෙහි ගොඩනගන සිතිවිලි සමූහයක් බවත් පෙන්වා දෙයි. සියලු සංජානන සහ සංවේදන පුද්ගල මනසෙහි ගොඩනැගෙන සංකල්පයන් ය. අපගේ අනුභූතියට ගොදුරු වන දර්ශන, දර්ශන මාත්‍ර වූ බාහිර වස්තු මිස සත්‍ය වශයෙන් බාහිර වස්තුවක් නොමැත. සෑම විට ම සියල්ල සංජානනය කරන විශ්ව විග්‍රහයක් ඇත. ඒ දෙවියන් වහන්සේ ය.

විඥානය පිළිබඳ තවත් වැදගත් අදහසක් දැක් වූ දාර්ශනිකයෙක් ලෙස **ෆික්ට් නැමැත්තා** සඳහන් වේ. ඔහු විඥානය නිර්මාණාත්මක සහ පරිණාමීය පදාර්ථයක් ලෙස



CamScanner

දක්වයි. අප දක්නා විෂය ලෝකයේ ලක්‍ෂණ මෙයින් ඉදිරිපත් වේ. මූලික වශයෙක් පාරභෞතික දෘෂ්ටිකෝණ 02ක් මෙහි දී දැකගත හැකි ය. එනම් සියල්ල භෞතික හේතූන් මත ඇතිවන බව කීම සහ සියලු දේ ම මානසික හේතූන් මත ඇතිවන බව කීම යි. මින් කිසිවක් සනාථ කිරීම හෝ අනාථ කිරීම කළ නොහැකි ය.

බුදුසමය තුළ විඥානය පිළිබඳ දාර්ශනිකව විග්‍රහයට ලක්වන්නේ යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය තුළිනි. දෙවන ධර්ම සංගායනාවෙන් අනතුරුව සසුන තුළ බෞද්ධ දාර්ශනික සංකල්ප සියුම්ව විග්‍රහයට ලක්වීමේ ප්‍රතිඵලයක් ලෙස පසුකාලීනව හීනයාන, මහායාන, තන්ත්‍රයාන වශයෙන් සසුන කොටස් තුනකට බෙදී ගිය අතර මහායාන සම්ප්‍රදායට අයත් යෝගාචාරීහු යෝග අභ්‍යාසයන්ට මූලිකත්වය ලබා දෙමින් නිර්මාණය කරගනු ලැබූ චිත්ත ශක්තිය තුළින් විඥානය පිළිබඳ සියුම් වූ දාර්ශනික විග්‍රහයක් ඉදිරිපත් කළහ.

අපගේ මෙම ග්‍රන්ථය මඟින් යෝගාචාර විඥානවාදී ආකල්පයන් මූලික බුදුසමය සමඟ තුලනය කරමින් අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ.

කරපික්කඩ සෝභිත හිමි,
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය,
කැලණිය විශ්ව විද්‍යාලය,
කැලණිය.



CamScanner

# සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| දී.නි. | - | දීඝ නිකාය |
| ම.නි. | - | මජ්ඣිම නිකාය |
| සං.නි. | - | සංයුත්ත නිකාය |
| අං.නි. | - | අංගුත්තර නිකාය |
| ඛු.නි. | - | ඛුද්දක නිකාය |
| සු.නි. | - | සුත්ත නිපාත |
| බු.ජ.මු. | - | බුද්ධජයන්ති මුද්‍රණය |
| වි.ම. | - | විසුද්ධි මාර්ගය |
| වි.මා.සි. | - | විඥප්තිමාත්‍රතා සිද්ධිඃ |

# පටුන

පිදුම i

උපකාරානුස්මෘතිය ii- iii

හැඳින්වීම iv-xi

සංකේත නිරූපණය xii

මාතෘකාව පිටුව

පළමුවන පරිච්ඡේදය

විඤ්ඤාණය පිළිබඳ මුල් බුදුසමයාගත ඉගැන්වීම් 1-36

- ප්‍රවේශය
- චිත්ත, මනො, විඤ්ඤාණ විග්‍රහය
- චිත්ත
- මනො
- විඤ්ඤාණ
- අරමුණු විෂයකරගැනීමෙහි ලා විඤ්ඤාණයේ ප්‍රමුඛතාවය
- විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය
- පුද්ගලයාගේ සංසාර ප්‍රවෘත්තිය සහ විඤ්ඤාණය



CamScanner

දෙවන පරිච්ඡේදය

යෝගාචාර විඥානවාදය බිහිවීමෙහිලා මුල් බුදුසමයාගත සහ නිකායාන්තර බලපෑම් 37-65

- ප්‍රවේශය
- විඥානවාදය විෂයෙහි බලපෑ මුල්බුදුසමයාගත මූලබීජ
- විඥානවාදය බිහිවීමෙහිලා නිකායාන්තර බුදුසමයේ බලපෑම
- ස්ථවිරවාදය
- පුද්ගලවාදය
- සර්වාස්තිවාදය
- සෞත්‍රාන්තික නිකාය
- මාධ්‍යමික නිකාය

තෙවන පරිච්ඡේදය

විඥානය පිළිබඳ ඉගැන්වීම්, යෝගාචාර නිකායෙහි විඥප්තිමාත්‍රතාව දක්වා වර්ධනය වීම 66-92

- යෝගාචාර විඥප්තිමාත්‍රතා සංකල්පය හැඳින්වීම (විඥප්තිමාත්‍රතා සංකල්පය, විඥප්තිමාත්‍රතාසිද්ධිඃ විංශතිකා සහ ත්‍රිංශතිකා ග්‍රන්ථ ඇසුරින් විමර්ශනය කිරීම)
- විඥාන පරිණාමය
- ත්‍රිඃස්වභාවය

- ආර්යලංකාවතාර සූත්‍රයෙහි අන්තර්ගත විඥප්තිමාත්‍රතාව පිළිබඳ විග්‍රහය

සිව්වැනි පරිච්ඡේදය
ආදිබුද්ධදහම සහ යෝගාචාර විඥානවාදී ඉගැන්වීම් අතර තුලනය 93-110

- විඥප්තිමාත්‍රතාවය
- ත්‍රිවිධපරිණාමය
- ත්‍රිඃස්වභාවය

ආශ්‍රිත ග්‍රන්ථ 111-117




CamScanner